**ශ්‍රී ලන්කන් කේටරින් සමාගම - 2020/2021**
**-----------------------------------------------**

## 1.1 මතය

**------**

ශ්‍රී ලන්කන් කේටරින් සමාගමේ ("සමාගම") 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.
සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**-------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා

බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානයවාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව ,පොත්පත් ,පරිපාටි ,පද්ධති , වාර්තා හා ,පොත්පත් ,පරිපාටි ,මාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධතිහා ප්‍ර වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමණාකරනයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වතක්ම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකරණයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021මාර්තු 31 දිනට සමාගමේ මුළු වෙළෙඳ ලැබිය යුතු මුදල රුපියල් මිලියන 6,258 ක් වූ අතර ,එම ශේෂයෙන් ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමෙන් ලැබිය යුතු මුදල සියයට 99 ක් හෙවත් රුපියල් මිලියන 6,200 ක් බව නිරීක්ෂණය විය. එම ශේෂයෙන් රුපියල් මිලියන 5,919 ක් වසරකට වැඩි කාලයක් පැවතුනි. තවද 2021 ,මාර්තු 31 දිනට ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම වෙතින් ලැබිය යුතු ශේෂය, රුපියල් මිලියන 9,675ක් වූ සමාගමේ මුළු වත්කම්වලින් සියයට 64 ක් නියෝජනය විය . තවද ,එම ශේෂය අයකර ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම සහ මුදල් ,ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය තහවුරු කිරීමේ ලිපි නිකුත් කර ඇත.<br>කෙසේ වෙතත් ,ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 09 ප්‍රකාර අපේක්ෂිත ජීවිත කාලය අනුව ණය පාඩු නිර්ණය කිරීමේදී ප්‍රතිපාදන න්‍යාසයක් භාවිතා කර ගිණුම්වල ලැබිය යුතු මුදල් හානිකරණය හඳුනාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම වෙතින් එම ශේෂයන් අයකර ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කරමින් සිටී. | ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමෙන් ලැබිය යුතු මුදල් අයකරගත යුතුයි. |

**1.7 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) ආපදා යථා තත්ත්වයට පත්කිරීමේ (Disaster Recovery- ) අඩවිය සමාගම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි DR . අඩවිය නොමැති වීම හේතුවෙන් විනාශකාරී දත්ත නැතිවීමේ සිදුවීමක් හෝ අක්‍රිය කාල පරිච්ඡේදයක් නිසා ආයතනය අඩපණ කළ හැකි අවදානම වැඩි කරයි. | ශ්‍රී ලංකා කේටරින් සමාගම සඳහා පිරිවැය-ඵලදායී DR විසඳුමක් ඇගයීමට ලක් කරමින් සිටී .කෙසේ වෙතත් ,රජයේ වියදම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති නව රාජ්‍ය මුදල් චක්‍රලේඛය හේතුවෙන් මෙය දැන් අත්හිටුවා ඇත. | DRවිසඳුමක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සමාගම විසින් ඇගයීමට ලක් කළ යුතුය. |
| ආ) තොරතුරු ආරක්ෂණ) Information Security - (ISප්‍රතිපත්තිය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) අවසාන පරිශීලක ආරක්ෂණ (End User Security) ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබූ අතර සැලකිය යුතු කාලයක් සඳහා කෙටුම්පත් අදියරේ පැවතුනි. | තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ලේඛනය සමූහ තොරතුරු තාක්ෂණ (Group IT) අංශය විසින් සමාලෝචනය කර අනුමත කර ඇත .රජයේ වියදම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති නව රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව විගණන කමිටුව /අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනේ. | ISප්‍රතිපත්තිය සහ ICT අවසාන පරිශීලක ආරක්ෂණ ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර එය නිතර සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු .මිලියන 903 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපව පූර්ව වර්ෂයේ ලාභය රු .මිලියන 4,763 ක් විය. මේ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 5,666 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වසරේ ගුවන්යානා සඳහා ආහාර සපයන මුළුතැන්ගේ (Flight Kitchen) ආදායම රුපියල් මිලියන 7,209 හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය තුළ එම ආදායම රුපියල් මිලියන 473 ක් දක්වා අඩුවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 මූල්‍ය විශ්ලේෂණය

සමාගමේ 2017/18 වර්ෂයේ සිට 2020/21 දක්වා එකතු කල අගය ක්‍රමයෙන් අඩු වී ඇත. විස්තර පහත දැක්වේ.

( රු.මිලියන)

| විස්තරය | 2020/21 | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 |
|---|---|---|---|---|---|
| ------------- | ---------- | --------- | ---------- | --------- | --------- |
| බදු පසු ලාභය (ලාභාංශය ගෙවීමට පෙර) | (903.40) | 4,759.51 | 5,602.50 | 3,890.30 | 3,736.39 |
| එකතු: | | | | | |
| සේවක පඩිනඩි | 948.52 | 1 202.97 | 1,128.26 | 1,019.78 | 890.15 |
| රජයට ගෙවූ ලාභාංශ (සෘජු) | | | | | |
| වරණීය කොටස් | 16.40 | 130.10 | 130.10 | 130.10 | 130.10 |
| සාමාන්‍ය කොටස් | 3,569.63 | 1,701.25 | 3,280.18 | 5,314.10 | 3,093.48 |
| රජයට ගෙවූ බදු | | | | | |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | 0.41 | 0.55 | 0.16 | 0.58 |
| එකතු කළ අගය මත බදු | 2.59 | 7.64 | 13.55 | 11.42 | 13.13 |
| වෙනත් බදු (ESC) | - | 33.95 | 48.79 | 41.99 | 34.73 |
| ක්ෂය හා ක්‍රමක්ෂය කිරීම් | 449.72 | 377.72 | 218.33 | 196.55 | 284.67 |
| එකතුව | **4,083.45** | **8,213.55** | **10,422.26** | **10,604.40** | **8,183.23** |

ප්‍රධාන වශයෙන් ලාභය සහ සාමාන්‍ය කොටස් සඳහා වූ ලාභාංශ ඉහළ යාම හේතුවෙන් සමාගමේ එකතු කල අගය 2017/18 වසර දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, සාමාන්‍ය කොටස් සඳහා වූ ලාභාංශවල අඩුවීම හේතුවෙන් එම අගය 2018/19 සිට 2019/20 දක්වා අඩු වී තිබුණි. COVID-19 වසංගතය හේතුවෙන් ලාභයේ අඩුවීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී එම අගය පෙර පැවති තත්වයට වඩා අඩුවී තිබුණි.

## 2.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

වසර පහක් සඳහා මාර්තු 31 දිනට සමාගමේ තත්ත්වයට අදාළ වැදගත් අනුපාත පහත පරිදි වේ.

| | 2020/21 | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් වලට ජංගම වගකීම් (වාර ගණන) | 16.67 | 6.16 | 7.82 | 6.44 | 8.76 |
| ක්ෂණික අනුපාතය | 16.26 | 6.01 | 7.55 | 6.14 | 8.46 |
| ණය හිමිකම් අනුපාතය | 0.19 | 0.14 | 0.21 | 0.26 | 0.19 |
| EPS - කොටස් අනුපාතය | (0.96) | 5.06 | 5.96 | 4.14 | 3.97 |
| කොටසකට ලාභාංශය | - | 3.80 | 4.47 | 3.10 | 3.38 |
| දළ ලාභ අනුපාතය | 53% | 81% | 79% | 77% | 77% |
| හිමිකමට ඉපැයුම | 12% | 39% | 59% | 58% | 46% |
| තොග පිරිවැටුම් අනුපාතය | 1.33 | 5.19 | 5.99 | 6.35 | 6.22 |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) සමාලෝචිත වර්ෂය තුළ ජංගම වත්කම් හා ජංගම වගකීම් අනුපාතය සහ ක්ෂණික අනුපාතය ඉහළ ගොස් ඇති අතර, ඒ සඳහා නිදහස් කළ හැකි වරණීය කොටස් සියයට සියයකින් අඩුවීම සහ වෙළඳ ගෙවිය යුතු සහ අනෙකුත් ගෙවිය යුතු දේවල අඩුවීම හේතුවෙන් ජංගම වගකීම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ආ) සමාගම බදු ගෙවීමෙන් පසු අලාභයක් ලබා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කොටසක ඉපැයීම් රුපියල් 6.02 කින් එනම් සෘණ 0.96 දක්වා අඩු වී තිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් අඩුවීම හේතුවෙන් තොග පිරිවැටුම් අනුපාතය සියයට 74 කින් අඩුවී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

සමාගමේ අරමුණු වන්නේ ගුවන්යානා සඳහා ආහාර සපයන මුළුතැන් ගෙවල් මෙහෙයවීම හා නඩත්තු කිරීම, ආහාරපාන සහ ගුවන් මගීන්ට අවශ්‍ය වෙනත් දේ සැපයීම, (Victuals) ගුවන් සේවා සඳහා මගී නවාතැන් පවත්වාගෙන යාම, ගබඩා හා බන්ධිත ගුදම් අත්පත් කර ගැනීම සහ සැපයීම ආදිය සහ කුඩා හා විශාල ආපනශාලා (Cafe & Restaurant) හිමිකරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමත් වේ. සමාගමේ එක් එක් උත්පාදන ඒකක වල පසුගිය වර්ෂ 03 සඳහා විකිණුම් ආදායම් සහ ලාභ/ අලාභ පහත පරිදි වේ.

| ආදායම් ප්‍රභවය | 2020/21 | | 20/2019 | | 19/2018 | |
|---|---|---|---|---|---|---|
| | මුළු ආදායම | වර්ෂය සඳහා ලාභ / අලාභ | මුළු ආදායම | වර්ෂය සඳහා ලාභ / අලාභ | මුළු ආදායම | වර්ෂය සඳහා ලාභ / අලාභ |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ගුවන්යානා වලට ආහාර සපයන මුළුතැන් ගෙවල් (Flight Kitchen) | 475.80 | (713.66) | 7,219.43 | 4,101.20 | 7,825.30 | 4,799.99 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (BIA) | 87.05 | (126.83) | 1,219.99 | 435.29 | 1,266.32 | 545.76 |
| වැනිලා පොඩ් (Vanilla Pod) | 49.31 | 11.15 | 34.00 | 7.16 | 31.88 | 6.96 |
| සෙමන්දු ආපනශාලාව (Semondu Restaurant) | 8.25 | (4.14) | 25.48 | 11.11 | 38.60 | (6.05) |
| ට්‍රාන්සිට් හොටෙල් (Transit Hotel) | (1.08) | (35.86) | 173.76 | 49.17 | 174.58 | 67.80 |
| එමිරේට්ස් ලොජ් (Emirates Lounge) | 22.76 | 6.03 | 128.33 | 65.21 | 140.23 | 73.56 |
| මත්තල රාජපක්ෂ | 24.36 | (2.21) | 7.5 | (1.96) | 12.8 | (15.47) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර ගුවන් තොටුපල ආපනශාලාව (MRIA) පිරිසුදු කිරීම් සේවා (Laundry) | 9.86 | (34.65) | 227.75 | 92.33 | 259.95 | 129.96 |
| ශීත කළ ආහාර (Frozen Foods-අලුතින් හඳුන්වා දී ඇත | 17.70 | (3.24) | - | - | - | - |
| | ----------- | ----------- | ----------- | ----------- | ----------- | ---------- |
| එකතුව | 694.01 | (903.41) | 9,036.24 | 4,759.51 | 9,749.66 | 5,602.51 |
| | ======= | ======== | ======= | ======== | ======= | ======= |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ (MRIA) ආපනශාලාව ආරම්භයේ සිටම පාඩු ලබමින් පවතී. පසුගිය වසරේ සහ සමාලෝචිත වර්ෂයේ අලාභය පිළිවෙලින් රුපියල් මිලියන 1.96 ක් සහ රුපියල් මිලියන 2.21 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා අලාභය රුපියල් මිලියන 0.25 කින් වැඩි වී තිබුණි.

(ii) අලුතින් හඳුන්වා දෙන ලද ශීත කළ ආහාර (Frozen meal) යන ආදායම් මාර්ගය මඟින් ද රුපියල් මිලියන 3.24 ක අලාභයක් ලබා තිබුණි.

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ------------- |
| ශ්‍රී ලන්කන් කේටරින් සමාගම විසින් 2030 වර්ෂයේදී ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් දැනුවත්ව නොසිටීම නිසා තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට අසමත්ව තිබූ අතරම, ඒවා ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාකාරකම්, ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ සංසිද්ධිස්ථාන හඳුනාගැනීම පිළිබඳ ඇගයීම සඳහා නිර්ණායකයන්ද හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව අමාත්‍යාංශය විසින් සමාගම දැනුවත් කර නොතිබුණි. කණ්ඩායමක් ලෙස තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මව් සමාගම (ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම) සමඟ එක්ව කටයුතු කරනු ලැබේ. | අදාල තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට සහ එම අරමුණු හා ඉලක්ක වලට අනුගතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වේ. |